# ශ්‍රී කුරුසියේ ජයග්‍රහණය

## මංගලය්‍යය

## පළමුවන දේව ප්‍රකාශනය ගණන් කථාව 21:4-9

*ගණන් කථාවෙන් උපුටා ගත් කොටසකි.*

"සර්පයෙක් යමෙකු දෂ්ට කළේ ද ඒ තැනැත්තා
ලෝකඩ සර්පයා දෙස බැලූ විට ඔහු සුවපත් විය."

ඔව්හු හෝර් නම් කඳුකරයෙන් නික්ම රතු මුහුදට යන මාර්ගය ඔස්සේ ඒදොම් නම් දේශය වටකර ගියහ. මෙසේ යන විට සෙනග බොහෝ සේ අධෛර්යයට පත් වූ හ. සෙනග දෙවියන් වහන්සේට සහ මෝසෙස්ට විරුද්ධ ව කතා කරමින්, "මේ පාළුකරයේ අප මැරෙන්නට ඇරීමට ඔබ අප මිසරයෙන් පිටතට ගෙනාවේ මන් ද? අපට කන්නත් නැත, බොන්නත් නැත. අපට ලැබෙන මේ සිල්ලර කෑම අපට දැන් තිත්ත වී ඇතැ" යි පැවසූ හ. එවිට සමිඳාණන් වහන්සේ සෙනග මැදට විසකුරු සර්පයන් එවූ විට, ඒ සර්පයෝ ඔවුන්ට දෂ්ට කළහ. ඉශ්‍රායෙල් සෙනග අතරේ බොහෝ දෙනෙක් නැසී ගියහ. එබැවින් සෙනග මෝසෙස් වෙත පැමිණ, "අපි සමිඳාණන් වහන්සේටත්, ඔබටත් විරුද්ධව කතා කිරීමෙන් පව් කෙළෙමු. මේ සර්පයන් අප මැදින් ඉවත් කරන ලෙස උන් වහන්සේට යාච්ඤා කරන්නැ" යි ඉල්ලූ හ. මෝසෙස් ද සෙනග උදෙසා යාච්ඤා කෙළේ ය.

සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා කොට, "ලෝකඩ සර්පයෙකු සාදා රිටක් පිට තබන්න. දෂ්ට කරනු ලැබූ යමෙක් ඇද්ද, ඔහු එය දෙස බැලුවහොත්, සුව වනු ඇතැ"යි වදාළ සේක. එවිට මෝසෙස් ලෝකඩ සර්පයෙකු සාදා ඌ රිටක් පිට තැබී ය. සර්පයෙක් යමෙකු දෂ්ට කෙළේ ද ඒ තැනැත්තා ලෝකඩ සර්පයා දෙස බැලූ විට ඔහු සුවපත් විය.

*දේව වචනය මෙසේ ය.*

## පිළිතුරු ගීය ගීතාවලිය 78:1–2, 34–38

පිළිතුර: සමිඳුන්ගේ ප්‍රබල ක්‍රියා අමතක නොකරන්න.

ගීය : මාගේ ජනයෙනි, මාගේ ඉගැන්වීමට කන් දුන මැනව.
මා පවසන වදන්වලට සවන් දුන මැනව.
උපමාවක් මගින් මම කතා කරන්නෙමි.
පුරාතනයේ අබිරහස් පවසන්නෙමි.

එතුමාණන් ඔවුන්ගෙන් සමහරුන් වැනසූ කල,
සෙසු අය එතුමාණන් සෙවුවෝ ය.
ඔව්හු පසුතැවී සිත් හරවා ගෙන දෙවිඳාණන් සොයා ගියෝ ය.
ඔවුන්ගේ පර්වතය දෙවිඳාණන් බව ඔව්හු සිහිපත් කළෝ ය.
ඔවුන්ගේ මිදුම්කරුන් උත්තම දෙවිඳාණන් බව ඔව්හු සිහි කළෝ ය.

එහෙත්, ඔව්හු එතුමන්ට තම මුවින් වාටු බස් කීවෝ ය:
දිවෙන් මුසා බස් දෙඩුවෝ ය.
ඔවුන්ගේ සිත් එතුමන් කෙරෙහි නිතර ම එකඟ නො වී ය.
එතුමන්ගේ ගිවිසුමට විශ්වාසවන්ත ව නොසිටියෝ ය.

එහෙත්, දයානුකම්පාවෙන් එතුමාණෝ
ඔවුන්ගේ පාප කමා කළ සේක:
ඔවුන් නොවැනසූ සේක:
විටින් විට තම කෝපය සංසිඳුවා ගෙන
තම උදහස ඇවිළෙන්නට ඉඩ නුදුන් සේක.

## දෙවන දේව ප්‍රකාශනය පිලිප්පි 2:6–11

*ශුද්ධ වූ පාවුලු තුමන් විසින් පිලිප්පිවරුන්ට ලියන ලද පළමුවන හසුනෙන් උපුටා ගත් කොටසකි.*

"දෙවියන් වහන්සේ උන් වහන්සේ අති උසස් තැනට නංවා වදාළ සේක."

උන් වහන්සේ, දෙවියන් වහන්සේගේ ස්වරූපය දැරූ නමුත්, දෙවියන් වහන්සේ හා සමානත්වය තමන් විසින් බදාගෙන ම තබාගත යුතු වස්තුවකැයි නොසිතා, තමන් වහන්සේම ත්‍යාජ කරගනිමින් වහලෙකුගේ මනුෂ්‍යාකාරයෙන් සිටිමින්, උන් වහන්සේ, මරණය එනම් කුරුසියේ මරණය දක්වා, පහත් වී කීකරු වූ සේක. එබැවින් දෙවියන් වහන්සේ උන් වහන්සේ අති උසස් තැනට නංවා, සියලු නාමයන්ට වඩා අග්‍ර නාමය උන් වහන්සේට දුන් සේක.

එසේ කළේ, ස්වර්ගයෙහි ද පොළොවෙහි ද, පාතාල ලෝකයෙහි ද සියල්ලන්, 'ජේසුස්' යන නාමයට දණ නමන පිණිසත්, ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ සමිඳාණන් වහන්සේ යයි දෙවියන් පියාණන් වහන්සේගේ මහිමය සඳහා, සෑම දිවකින් ම ප්‍රකාශ කරන පිණිසත් ය.

*දේව වචනය මෙසේ ය.*

## සුපුවත් ජය නද

ආලේලූයා! ආලේලූයා!
ක්‍රිස්තුනි, ඔබට නමස්කාර කර ස්තුති ප්‍රශංසා කරමු.
මක්නිසාදයත් ඔබගේ ශ්‍රී කුරුසියෙන්
ඔබවහන්සේ ලෝකය ගළවා ගත් සේක.
ආලේලූයා!

## සුවිශේෂය

ජොහන් 3:13–17

*සුවිශේෂක ජොහන් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

**"මනුෂ්‍ය පුත්‍රයාණන් ඔසවනු ලබන්නට ඕනෑ ය."**

"ස්වර්ගයෙන් බැස වදාළ මනුෂ්‍ය–පුත්‍රයාණන් හැර, අන් කිසිවෙක් ස්වර්ගයට නොනැංගේ ය. පාළුකරයෙහි දී මෝසෙස් සර්පයා එසවූ ලෙස ම මනුෂ්‍ය–පුත්‍රයාණන් ද, උන් වහන්සේ කෙරෙහි අදහාගන්නා සෑම දෙන ම සදාතන ජීවනය ලබන පිණිස, ඔසවනු ලබන්නට ඕනෑ ය.

දෙවියන් වහන්සේ ලෝකයාට කොතරම් ප්‍රේම කළ සේක් ද කීවොත්, ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් වුව ද ලොවට දෙවා වදාළ සේක. එසේ කෙළේ උන් වහන්සේ කෙරෙහි අදහන සියලු දෙනා ම විනාශ නොවී සදාතන ජීවනය ලබන පිණිස ය. දෙවියන් වහන්සේ ස්වකීය පුත්‍රයාණන් ලොවට එවා වදාළේ, ලෝකයා විනිශ්චය කරන පිණිස නොව, උන් වහන්සේ කරණකොටගෙන ලෝකයා ගළවනු ලබන පිණිස ය.

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*